ජයතුංග, එම්.
PAPER

# මණිමේකලා දෙවඟන

එම්.ජයතුංග,ලලිත කලා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

දේශීය ජන යාතුකර්ම සාහිත්‍යයේ සහ පන්සිය පණස් ජාතක පොතේ මණිමේකලා දෙවඟන පිළිබඳ සඳහන්ව ඇත්තේ මහ සයුරට අධිගෘහිත දේවතාවියක ලෙසිනි. ජාතක පොත පදනම් ව සැකසුණු විහාර බිතු සිතුවම ද ඇය නිරූපණය කරනුයේ මුහුදට අධිපති දෙවඟන ලෙසයි. ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල දෙමළ වැසියන්ගේ ජන ඇදහිලි අතරේ ද ඇයට හිමි වනුයේ ගෞරවණීය ස්ථානයකි. මුහුදට පා කර හැරි විහාර මහා දේවිය මාගම් පුරය වෙත නිරුපද්‍රිත ව රැගෙන ගියේ ද මණිමේකලා දෙවඟන විසිනැ යි ජන විශ්වාසයක් පවතී. මේ අනුව මණිමේකලා මුහුදට අධිගෘහිත දෙවඟනක ලෙස ලාංකේය සමාජයේ තහවුරුව පැවති බවට ප්‍රමාණවත් සාධක පවතී. එසේම ඇය දක්ෂිණ භාරතයේ වෙළඳ ශ්‍රේණි අතර ආරක්ෂක දෙවඟනක ලෙස පුද ලබා ඇත.

ඉළංගෝ ආඩිගල් නම් කවියා විසින් රචනා කරන ලද සිලප්පදිකාරම් නම් දෙමළ වීර කාව්‍යයේ ප්‍රධාන චරිතයක් වන කෝවලන් නම් වෙළඳ තරුණයාට දාව මාධවී නම් නර්තකිය බිහිකළ දියණිය ද මණිමේකලා ය. සීතලයි සාත්තරාන් නමැත්තකු විසින් රචනා කරන්නට ඇතැයි සැලකෙන මණිමේකලා නම් දෙමළ වීර කාව්‍යයෙන් විවරණය වන්නේ ඇයගේ මිථ්‍යා චරිතාපදානය යි. පසු කලෙක මුහුදට අධිගෘහිත දෙවඟන වශයෙන් පූජාර්හ බවට පත් වන්නේ මණිමේකලා නම් වූ මාධවීගේ හා කොවාලන්ගේ දියණිය ද යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

පත්තිනි දෙවඟන සහ දෙවොල් දෙවියන් මූලිකව පූජාවට පාත්‍ර කෙරෙන ගම්මඩු සහ දෙවොල් මඩු ශාන්තිකර්මවල අන්තර්ගත"දෙවොල් ගොඩ බැසීම" නම් අංගයේදී නිරූපණය වන්නේ කාවේරියේ සිට සිංහලද්වීපය කරා නැව් සතකින් පැමිණෙන වෙළඳ කුමරුවන් සත් දෙනෙකු සිය මුහුදු ගමනේ සත්වන දිනයේදී මුහුදුබත් වීමේ සිද්ධියයි. බොහෝ අත් පිටපත්වල සඳහන් පරිදි ශෛලමය පාරු හතක් මවා දී ඔවුන් මෙම උපද්‍රවයෙන් මුදවා ගත්තේ මණිමේකලා දෙවඟනයි.

සියලු දෝෂ දුරු කරණු වස් ගම්මඩු හා දෙවොල් මඩු ඇතුළු බොහෝ ශාන්තිකර්ම අවසානයේ රඟ දැක්වෙන "ගරා නැටීම" නම් අංගයේ එන ගායනාවලින් පැවසෙන්නේ සියලු දොස් ගෙයින් පිටතටත්, වරින් වර වසින වැසි ජලයෙන් සේදී ගංගා ඇළ දොළ ඔස්සේ ගලා ගොස් ගඟ දියටත් එක්වන අතර එය මහ මුහුද කරා ගෙන යන්නේ මණිමේකලා දෙවඟන විසින් බව ය. පන්සිය පණස් ජාතක පොතේ එන මහ ජනක ජාතකයේ යුද පිණිස ධනය රැස්කරණු වස් වෙළඳාමේ යමින් සිටියදී මහ සයුරේදී විපතට පත් බෝසතුන් ගලවා ගනුයේ ද මණිමේකලා දෙවඟනයි. කරගම්පිටිය සුබෝධාරාම විහාරයේ ප්‍රතිමා ගෘහයේ මෙම අවස්ථාව සිතුවම් ව තිබේ. තායිලන්තයේ අතිශය ජනප්‍රිය විෂයයක් වූ මෙය වට් යයි ඉන්දාරාම්, ටා කු, කොන්කාරාම්, වට් චොං නොන්සි ආදී විහාරයන්හි ද සිතුවම් ව ඇත. මේ කරුණුවලින් තහවුරු වන්නේ ඇය මුහුදට අධිගෘහිත දෙවඟනක ලෙස ආසියාතිකයන් අතර පිළිගැනීමට පාත්‍රව පැවති බව යි.

සර්ග තිසකින් සමන්විත සාත්තරාන්ගේ මණිමේකලායි නම් කාව්‍යයේ විස්තර වන්නේ මාධවීගේ දියණිය වූ මණිමේකලා බුදු දහම වැළඳ ගැනීමේ සිදුවීමයි. ඒ අනුව ඇය තමාට උමතු ලෙස ආලය කළ උදයකුමාරන් නම් චෝල කුමරාගෙන් ගැලවෙනු පිණිස කාවේරිපටුනේ සිට මනිපල්ලවම් හෙවත් නූතන නෙයිනතිවු බලා ගමන් ගත් බවයි. ඇය නිද්‍රා ගැන්වූ මණිමේකලා නම් දෙවඟන ඇයට නෙයිනතිවු බලා යාත්‍රා කිරීමට සහාය වූ බව එහි තව දුරටත් සඳහන් වේ. ඇය පිටත්ව ගිය පසු මුහුද ගොඩ ගලා කාවේරිපටුන මුහුදුබත් වූ හෙයින් එය මුහුදු දෙවඟන උදයනාරායන්ට දුන් දඬුවමක් ලෙස සැලකිණි.

නල්ලූර්හි නාගපූසාරි අම්මාන් කෝවිලේ මහාසංසාභිෂේකම් උත්සව සමයේ ඇය සහ කන්නකිය විශේෂයෙන් සිහිපත් කෙරෙන අතර, කන්නකිය මණිමේකලා සමග නෙයිනතිවු දූපතට සපැමිණි බව ප්‍රදේශවාසීහු තරයේ අදහති. කන්නකිය (පත්තිනි) දේවත්වයෙහි ලා සලකන බැවින් කෝවලන්ගේ දියණිය වූ මණිමේකලා ද දේවත්වයෙහි ලා සලකන්නට ඇතැයි අනුමාන වශයෙන් නිගමනය කළ හැක.